# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/03 - 2023 ඔක්තෝබර් මස 30 වැනි සඳුදා - 2023.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේඅංකය:* KDS/DEL/4/4/10/12.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය :* LD/05/2004/PC/106.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලහා ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක ක.සි. 320706 හි කැබලි අංක 1 වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0824 ක් වූ ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: ගලහාවත්ත; හිමිකම් කියන්නෝ: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්: 0.0824.

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගලහාවත්ත සහ මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය) නැගෙනහිරට: මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ අඩිපාර දකුණට: අඩිපාර සහ මාර්ග (ප්‍රාදේශීය සභා) බටහිරට: මාර්ග (ප්‍රාදේශීය සභා).

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2023.12.18 වැනි දින පූ.භා. 10.30 ට දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2023.11.30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩම්/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර පරීක්ෂණ දිනයේ දී ඔප්පු හා වෙනත් ලියකියවිලි මා වෙත ඉදිරිපත් කළ යුතුය.

ඩී. ආර්.කේ. හෙන්නායක,
ප්‍රාදේශීය ලේකම්/
දෙල්තොට

2023 ඔක්තෝබර් මස 25 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0295

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.